WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020

# 14 - කතෝලික ධර්මය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 14 - කතෝලික ධර්මය

## අවසාන ලකුණු ගණනය කිරීම

### I ප්‍රශ්න පත්‍රය

බහුවරණ 1 - 40 = 1 x 40 40 = 40

### II ප්‍රශ්න පත්‍රය

1 ප්‍රශ්නය (අනිවාර්ය)

1 - 10 දක්වා = 2 x 10 20 = 20

2 ප්‍රශ්නය ( 2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

3 ප්‍රශ්නය

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

4 ප්‍රශ්නය

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

5 ප්‍රශ්නය

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

WWW.OLEVELAPI.COM

6 ප්‍රශ්නය

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

7 ප්‍රශ්නය - කෙටි සටහන් දෙකක් සඳහා

5 + 5 10

**එකතුව** 04 x 10 = 40

100

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක** 03

(i) ..............................................................
..............................................................
.............................................................. √ △ $\frac{4}{5}$

(ii) ..............................................................
..............................................................
.............................................................. √ △ $\frac{3}{5}$

(iii) ..............................................................
..............................................................
.............................................................. √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

WWW.OLEVELAPI.COM

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

WWW.OLEVELAPI.COM

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved/

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය වන ශුද්ධ බයිබලයේ අඩංගු පොත් සංඛ්‍යාව,
(1) 46 කි. (2) 70 කි. (3) 72 කි. (4) 73 කි.

2. 'තියෝපිලස්' යන නමේ අර්ථය කුමක් ද?
(1) මහා ධර්මදූතයා (2) චිත්‍ර ශිල්පියා
(3) කල්‍යාණ මිත්‍රයා (4) දෙවියන් වහන්සේගේ මිත්‍රයා

3. සිමියොන්තුමාගේ ප්‍රශංසා ගීය ගායනා කරනු ලබන්නේ කුමන යාම යැදුමේදී ද?
(1) උදේ (2) දිවා (3) සැඳෑ (4) රාත්‍රී

4. මුල් කිතුනු සභාවේ ගැටලුවක් ඇති වූයේ පහත සඳහන් කුමන කරුණක් සම්බන්ධයෙන් ද?
(1) ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම (2) සහනාධාර බෙදාදීම
(3) සහභාගී වීම (4) යාච්ඤා කිරීම

5. අසහාය ධර්මදූතයකු වූ ශුද්ධ වූ පාවුලුතුමා හඳුන්වන නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා (2) දමස්කයේ අපොස්තුළුවරයා
(3) ධර්මදූතයන්ගේ අපෝස්තුළුවරයා (4) රෝමයේ අපෝස්තුළුවරයා

6. "එහෙත් ඔබ කියන සේක් නම් දැල් හෙළමි" යැයි පැවසුවේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ ජාකොබ්තුමා (2) ශුද්ධ වූ ජුවාම්තුමා
(3) ශුද්ධ වූ පේදුරුතුමා (4) ශුද්ධ වූ පාවුලුතුමා

7. සභාව ශුද්ධවන්ත වන්නේ,
(1) ශුද්ධ වූ දේශය තුළ ආරම්භ වූ නිසා ය. (2) ශුද්ධ වූ බයිබලයේ සඳහන් වන නිසා ය.
(3) විශ්වීයව ව්‍යාප්ත වූ නිසා ය. (4) ශුද්ධ වූ ත්‍රිත්වයට ඇති සම්බන්ධතාව නිසා ය.

8. "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ ම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේදී ඉටු කර ගත නොහැකි ය" යැයි ප්‍රකාශ කළේ කවුරුන් ද?
(1) I වන ජුවාම් පාවුලු පාප්වහන්සේ
(2) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා
(3) ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
(4) ශුද්ධ වූ II වන ජුවාම් පාවුලු පාප්වහන්සේ

9. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) යාගය සහ යාච්ඤාව (2) ගිවිසුම සහ අයැදුම
(3) ස්තුති කිරීම සහ පරිස්මරණය (4) භෝජනය සහ ඉල්ලීම

10. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග තුනක් වන්නේ,
(1) පාස්කු බැටලුවා, තිත්ත පලා සහ මිදි යුෂ ය.
(2) නුමුහුන් රොටී, තිත්ත පලා සහ තිරිඟු පූප ය.
(3) මිදි යුෂ, තිරිඟු පූප සහ තිත්ත පලා ය.
(4) පාස්කු බැටලුවා, නුමුහුන් රොටී සහ තිරිඟු පූප ය.

11. විෂ ශරීර ගතකොට මරණයට පත් කරන ලද පියතුමා කවුරුන් ද?
(1) මැක්සිමිලියන් කෝල්බේ (2) ජාකෝමේ ගොන්සාල්වෙස්
(3) මනුවෙල් ද මිරැන්ඩා (4) මයිකල් රුද්‍රිගු

12. 'විශ්වාසයේ පියා' යන විරුදාවලිය ලැබූ එඬේරික ජීවිතයක් ගත කළ තැනැත්තා කවුරුන් ද?
(1) ශුද්ධ වූ පේදුරුතුමා (2) සකරියස්තුමා (3) ශුද්ධ වූ ජුඩ්තුමා (4) ආබ්‍රහම්තුමා

13. දෙමාපියන්ට කීකරු වීම, ගෞරව කිරීම හා ඔවුන්ව රැකබලා ගැනීමට අපට නියම කරන්නේ කී වැනි දේව පනතින් ද?
(1) තුන්වන (2) හතරවන (3) පස්වන (4) හයවන

14. මව් කුසේ පිළිසිඳ ගැනීමට පෙර පටන් දෙවියන් වහන්සේ අපව හඳුනාගෙන සිටින බව පෙන්නුම් කරනු ලබන්නේ කුමන දිවැසිවරයාගේ කැඳවීම මඟින් ද?
(1) ආමෝස් (2) නාතාන් (3) ජෙරමියා (4) මීකා

- පහත සඳහන් ප්‍රකාශ ඇසුරෙන් ප්‍රශ්න අංක **15** සහ **16**ට පිළිතුරු සපයන්න.

A - අසභ්‍ය වෙබ් අඩවි නැරඹීම
B - හොර ඡන්ද දැමීම
C - පොදු දේපළ විනාශ කිරීම
D - විවාහ පොරොන්දු කඩ කිරීම
E - හොඳ නම විනාශ කිරීම

15. හයවන සහ නවවන දේව පනත්වලට විරුද්ධ ක්‍රියා වන්නේ,
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා E ය.

16. හත්වන සහ දහවන දේව පනත්වලට විරුද්ධ ක්‍රියා වන්නේ,
(1) B හා C ය. (2) B හා E ය. (3) C හා D ය. (4) C හා E ය.

17. අනනියස් සහ සපිරා සිද්ධියෙන් අපට ලැබෙන පණිවුඩයක් වන්නේ,
(1) අන් අයට ගරු කිරීම ය. (2) බැහැපත්ව ජීවත් වීම ය.
(3) අවංකව කටයුතු කිරීම ය. (4) දිළිඳුන්ට දයාව දැක්වීම ය.

18. දිව්‍ය පූජා යාගයේදී ධර්මදූත ක්‍රියාවලියක් සඳහා අපව පිටත්කර හරින්නේ,
(1) දේශනයෙන් පසුව ය.
(2) දිව්‍ය සත්ප්‍රසාද ලැබීමත් සමඟ ය.
(3) ශුද්ධ වූ සුවිශේෂය ප්‍රකාශ කිරීමෙන් ය.
(4) අවසාන ආශිර්වාදයෙන් ය.

19. අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේදී ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් පිරිවරා කළ යැදුම කුමක් ද?
(1) විශ්වාසකයින්ගේ යාච්ඤාව
(2) උත්තම පූජක යාච්ඤාව
(3) පඬුරු මත යාච්ඤාව
(4) පරමණ්ඩල යාච්ඤාව

20. ගෙත්සෙමනේ උයනට යාච්ඤා කිරීම සඳහා ජේසුස් වහන්සේ කැඳවාගෙන ගිය ගෝලයන් වන්නේ,
(1) පේදුරු, ජුවාම් සහ ජාකොබ් ය. (2) මතෙව්, ජුවාම් සහ ජූඩ් ය.
(3) ජාකොබ්, ජූඩ් සහ මතෙව් ය. (4) පේදුරු, ජුවාම් සහ මතෙව් ය.

**21.** ඊශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා ගෙනයාම පිළිබඳ සඳහන් වන්නේ,
(1) උත්පත්ති පොතෙහි ය. (2) නික්මයාම පොතෙහි ය.
(3) විරාවලිය පොතෙහි ය. (4) I සාමුවෙල් පොතෙහි ය.

**22.** කතෝලික සභාව පිළිගනු ලබන පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ ගණන කීයද?
(1) 46 (2) 47 (3) 48 (4) 49

**23.** දෙවියන් වහන්සේ මෝසෙස්තුමාට තමන් වහන්සේ කවුරුන් දැයි හඳුන්වා දුන්නේ,
(1) ඊශ්‍රායෙල් ජනයා වහල්භාවයෙන් මුදවා ගැනීමෙන් ය.
(2) ළදරු මෝසෙස්තුමාව මරණින් බේරා ගැනීමෙන් ය.
(3) මෝසෙස්තුමාට හාස්කම් පෑමේ බලය දීමෙන් ය.
(4) නොදැවෙන කටු පඳුර තුළින් දර්ශනය වීමෙන් ය.

**24.** සාමාන්‍ය එඬේරික ජීවිතයක් ගත කළ ඊශ්‍රායෙල් ජනතාව සුවිශේෂී දේව ජනතාවක් බවට පත් වූයේ,
(1) චර්ම ඡේදනයෙන් ය. (2) රතු මුහුදින් එතෙර වීමෙන් ය.
(3) සීනයි ගිවිසුමෙන් ය. (4) පොරොන්දු දේශයේ පදිංචි වීමෙන් ය.

**25.** ශුද්ධ වූ සභා ඉගැන්වීම් අනුව ස්නාවක ජොහන්තුමා ජන්ම පාපයෙන් නිදොස් වූයේ,
(1) මරියතුමිය, එළිසබෙත්තුමියට ආචාර කිරීමේදී ය.
(2) දේවදූතයා සකරියස්ට දර්ශනය වූ විටදී ය.
(3) එතුමන්ට 'ජොහන්' යන නම තැබීමේදී ය.
(4) ජේසුස් වහන්සේව බෞතිස්ම ස්නාපනය කළ අවස්ථාවේදී ය.

**26.** ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය හා දූත මෙහෙවර ආරම්භ වන්නේ,
(1) උන්වහන්සේව දේව මාළිගයේ කැප කිරීමෙන් ය.
(2) ස්නාවක ජොහන්තුමාගෙන් ප්‍රසාද ස්නාපනය ලැබීමෙන් ය.
(3) සාතන්ගේ පරීක්ෂා වලින් ජය ගැනීමෙන් ය.
(4) කානා නුවර ජලය මිදි යුෂ බවට හැර වූ දේවබල ප්‍රකාශනය මගින් ය.

**27.** "ජීවත්වීම යනු ක්‍රිස්තුන් වහන්සේ සමඟ විසීම ය". මෙසේ පැවසුයේ,
(1) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා ය. (2) ශුද්ධ වූ අගොස්තීනුතුමන් ය.
(3) ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා ය. (4) අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් ය.

**28.** ස්වර්ග රාජ්‍යයට ඇතුළුවීමට නම් අප ප්‍රසාද ස්නාපනය ලැබිය යුතු බව සනාථ වන්නේ, ජේසුස් වහන්සේ විසින් කවරෙකුට පවසන ලද වචන වලින් ද?
(1) පේදුරුතුමාට (2) නිකදේමුස්ට
(3) ස්නාවක ජොහන්තුමන්ට (4) සමාරිය ස්ත්‍රීයට

**29.** පහත සඳහන් දේව ප්‍රසාද නිධාන සැලකිල්ලට ගන්න.
A - ප්‍රසාද ස්නාපනය
B - අභිවෘද්ධි ආලේපය
C - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
D - සමගි සන්ධානය
E - රෝගීන් ආලේපය
ඉහත දෑ අතුරෙන් සුවය දානය කිරීමේ හා දරාගැනීමේ ශක්තිය ලබාදෙන දේව ප්‍රසාද නිධාන අයත් වරණය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) C හා E ය. (4) D හා E ය.

**30.** රදගුරුතුමකුගේ නායකත්වය යටතේ ගිහියා සමඟ ජීවත් වෙමින්, ඔවුන්ට සේවය කරමින්, ඔවුන් සමඟ දේව රාජ්‍යය කරා ගමන් කිරීමට කැප වී සිටින්නේ,
(1) පැවිදි සොහොයුරන් ය. (2) පැවිදි සොහොයුරියන් ය.
(3) පදවි පූජා ප්‍රසාදිවරුන් ය. (4) පැවිදි පූජා ප්‍රසාදිවරුන් ය.

**31.** කිතුනු විවාහයේ සුවිශේෂී පරමාර්ථයක් වන්නේ,
(1) දෙපාර්ශවයේ දෙමාපියන්ගේ භෞතික අවශ්‍යතා සපුරාලීම ය.
(2) පවුලේ සැමට ජීවත්වීමට ඉඩමක් මිල දී ගෙන නිවසක් තැනීම ය.
(3) අන්‍යෝන්‍ය සහයෝගය හා ප්‍රේමය තුළ පරිපූර්ණත්වයට පත්වීම ය.
(4) සෑම දිනක ම එකිනෙකා වෙනුවෙන් නිශ්චිත කාලයක් වෙන් කිරීම ය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

32. තාපස දිවියේ පුරෝගාමීන් ලෙස සැලකෙනු ලබන්නේ,
(1) ශුද්ධ වූ ජකෝමියස්තුමා සහ ශුද්ධ වූ අන්තෝනිතුමා ය.
(2) ශුද්ධ වූ බෙනඩික්තුමා සහ ශුද්ධ වූ ජකෝමියස්තුමා ය.
(3) ශුද්ධ වූ අන්තෝනිතුමා සහ ශුද්ධ වූ අගොස්තීනුතුමා ය.
(4) ශුද්ධ වූ අගොස්තීනුතුමා සහ අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස්තුමා ය.

33. පූජක, පැවිදි සහ ගිහි සැමට අයත් දිවැසිවර කාර්යයේ ප්‍රධාන දූත සේවාව කුමක් ද?
(1) ධර්මදානය
(2) දිළිඳුන්ට ආධාර කිරීම
(3) රෝගීන්ට ප්‍රතිකාර කිරීම
(4) වැන්දඹුවන් බලා ගැනීම

34. දෙවියන් වහන්සේ විසින් මිනිස් අපගේ රැකවරණයට භාරකරන ලද දේව මැවිල්ල මනුෂ්‍ය වාසයට යෝග්‍ය වන්නේ,
(1) පොළොව පුරා පැතිර එය යටත් කිරීමෙන් ය.
(2) නව සොයාගැනීම් හරහා නිෂ්පාදනය වැඩි කිරීමෙන් ය.
(3) එය සංරක්ෂණය කරමින් පරිභෝජනය කිරීමෙන් ය.
(4) සතුන් පෝෂණය කරමින් සහ ඔවුන් බෝ කිරීමෙන් ය.

35. ඇතුළාන්ත සාමය ඇති කිරීම සඳහා,
(1) තම මව්බිම ස්වයං පෝෂිත කළ යුතු ය.
(2) කරදර අවස්ථාවලදී සන්සුන්ව සිටිය යුතු ය.
(3) යුද්ධය වැනි ප්‍රචණ්ඩ ක්‍රියා වලින් වැළකිය යුතු ය.
(4) අන් අයට සහ ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කළ යුතු ය.

36. අසල්වැසියාට ප්‍රේම කිරීමේ අරමුණ වන්නේ,
(1) ණය යුක්ති ඉටු කිරීම ය.
(2) දුගීන්ට උපකාර කිරීම ය.
(3) සියලු දේ බෙදා ගැනීම ය.
(4) සදාකාලික ජීවිතය ලබා ගැනීම ය.

37. එක්වරු ශීලය රැකීමට නියමිත වයස් සීමාව කුමක් ද?
(1) අවුරුදු 18-60
(2) අවුරුදු 18-65
(3) අවුරුදු 20-60
(4) අවුරුදු 20-65

38. දෙව් මිනිස් සංවාදය සඳහා කිතු සමිඳුන් අපට ලබාදුන් පූර්වාදර්ශය වන්නේ,
(1) නමෝ මරිය යාච්ඤාවයි.
(2) ගල්ලෙනේ යාච්ඤාවයි.
(3) ස්වාමිවාක් ආරාධනාවයි.
(4) උත්තම පූජක යාච්ඤාවයි.

39. මරියතුමියගේ ස්වර්ගාරෝපණය අපට වැදගත් වන්නේ,
(1) එතුමිය ස්වර්ගයේ රැජිණිය නිසා ය.
(2) ජන්ම දෝෂයෙන් නිර්දෝෂී වූ නිසා ය.
(3) එතුමියට අප තුළ ඇති ගෞරවය නිසා ය.
(4) අපේ උත්ථානය පිළිබඳ පෙර නිමිත්තක් නිසා ය.

40. පහත සඳහන් කරුණු සලකන්න.
A - කාර්ය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැදැකීමේ අපහසුව
B - පයින් ගමන් කිරීමට තිබූ අපහසුව
C - වයස්ගතව සිටීම
D - සිරගතව සිටීම
E - සහකරුවෙකු නොමැති වීම

මේවා අතුරෙන් ශාන්ත පාවුලුතුමා ලිපි ලිවීමට යොමු වූ කරුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A හා C
(2) A හා D
(3) B හා C
(4) B හා E

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2020

| විෂයය අංකය<br>பாட இலக்கம் | 14 | විෂයය<br>பாடம் | කතෝලික ධර්මය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 01 | 21. | 02 | 31. | 03 |
| 02. | 04 | 12. | 04 | 22. | 01 | 32. | 02 |
| 03. | 04 | 13. | 02 | 23. | 04 | 33. | 01 |
| 04. | 02 | 14. | 03 | 24. | 03 | 34. | 03 |
| 05. | 01 | 15. | 02 | 25. | 01 | 35. | 04 |
| 06. | 03 | 16. | 01 | 26. | 02 | 36. | 04 |
| 07. | 04 | 17. | 03 | 27. | 03 | 37. | 01 |
| 08. | 02 | 18. | 04 | 28. | 02 | 38. | 03 |
| 09. | 03 | 19. | 02 | 29. | 04 | 39. | 04 |
| 10. | 01 | 20. | 01 | 30. | 03 | 40. | 02 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் $01 \times 40 =$ 40

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>rupahd tpilfspd; njhif | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>gj;jpuk; I ,d; nkhj;jg;Gs;sp | 25 / 40 |
|---|---|---|---|



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

## කතෝලික ධර්මය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) ශුද්ධ වූ බයිබලයේ එළිදරව්වාදී ග්‍රන්ථ **දෙක** සඳහන් කරන්න.
(ii) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.
(iii) පුරාණ ගිවිසුමේ දවන පූජා වර්ග **දෙකක්** ලියන්න.
(iv) ජන වන්දනාවේ ප්‍රධාන අංග **දෙකක්** නම් කරන්න.
(v) ජේසුස් වහන්සේ විසින් අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේදී සිදු කළ කාර්ය **දෙකක්** ලියන්න.
(vi) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් **දෙකක්** සඳහන් කරන්න.
(vii) පාපයට වැටුණු ඒවට, දෙවියන් වහන්සේ දුන් දඬුවම් **දෙකක්** ලියන්න.
(viii) සුළු දිවැසිවරුන් **දෙදෙනෙකු** නම් කරන්න.
(ix) ශුද්ධ වූ ජොහන්තුමාගේ සුවිශේෂයේ සංකේතය දක්වා, එයින් ප්‍රකාශ වන අර්ථය ලියන්න.
(x) උත්පත්ති 3:6 ට අනුව හොඳ නරක අවබෝධ කරගැනීමේ ගසින් ඵල කඩා කෑම සඳහා ස්ත්‍රිය තම රුචිය ප්‍රකාශ කළ යෙදුම් **දෙකක්** ලියන්න.

**2.** (i) එළිදරව් සාහිත්‍යයේ දක්නට ලැබෙන සංකේත **දෙකක්** සඳහන් කරන්න.
(ii) එළිදරව් සාහිත්‍යයේ සංකේත ලෙස භාවිත කරන වර්ණ **තුනක්** ලියන්න.
(iii) ශුද්ධ වූ පේදුරුතුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගතහැකි ආදර්ශ **පහක්** විස්තර කරන්න.

**3.** (i) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු **දෙකක්** ලියන්න.
(ii) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු **තුනක්** ලියන්න.
(iii) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයෙන් සහ දේව වචනයෙන් පෝෂණය වන පවුලක සිය දරුවන් උදෙසා දෙමාපිය යුතුකම් **පහක්** විස්තර කරන්න.

**4.** (i) ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජනවන්දනා දින **දෙකක්** ලියන්න.
(ii) නත්තල් සමය තුළ සමරන වැදගත් මංගල්‍යයන් **තුනක්** නම් කරන්න.
(iii) ඉරුදින ශුද්ධවත්ව ගත කිරීම සඳහා ඔබෙන් ඉටු විය යුතු කාර්ය **පහක්** විස්තර කරන්න.

**5.** (i) පුරුෂයාගේ හදවතට සමීප ඉළ ඇටයකින් ස්ත්‍රිය මැවීමෙන් හඟවන කරුණු **දෙකක්** ලියන්න.
(ii) දෙවියන් වහන්සේ විසින් අප සැමට නිවැරදි මඟ යෑමට අවවාද කරන මාර්ග **තුනක්** ලියන්න.
(iii) උත්පත්ති පොතෙහි සඳහන් මැවීමේ පුවත් ඇසුරෙන් අවබෝධ කරගත හැකි කරුණු **පහක්** විස්තර කරන්න.

**6.** (i) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී "ක්‍රිසම්" (chrism) තෙලයෙන් ආලේප කිරීමෙන් කිතුනුවකු වශයෙන් අප ශක්තිමත් කරනු ලබන්නේ කුමකට දැයි කරුණු **දෙකක්** දක්වන්න.
(ii) ප්‍රසාද ස්නාපනයේදී භාවිත කරන සුදු වස්ත්‍රයෙන් සංකේතවත් කරන කරුණු **තුනක්** ලියන්න.
(iii) අභිවෘද්ධි ආලේපය නැමැති දේව ප්‍රසාද නිධානය ලැබීමට අවශ්‍ය සුදුසුකම් **පහක්** ලියන්න.

**7.** පහත සඳහන් මාතෘකා වලින් **දෙකක්** තෝරාගෙන, කෙටි සටහන් ලියන්න.
(i) භාග්‍යවත් තෙරේසා මවුතුමියගේ දයා සේවාව
(ii) පළමු දේව පනත අනුව දිවි ගත කරමු
(iii) සාන්ත වින්සන් ද පාවුලා සමිතිය
(iv) කිතුනුවකු වශයෙන් පරිසරය සුරැකීමට මාගේ දායකත්වය

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
කතෝලික ධර්මය II

1. (i) ශුද්ධවූ බයිබලයේ එළිදරව්වාදී ග්‍රන්ථ **දෙක** සඳහන් කරන්න.

- පුරාණ ගිවිසුම: දානියෙල් පොත
- නව ගිවිසුම: එළිදරව්ව පොත

(ii) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

- ජෝබ්
- ගීතාවලිය
- හිතෝපදේශය
- ධර්ම දේශකයා
- ප්‍රේම ගී
- ප්‍රඥාව
- සිරාක් හෙවත් උපදේශකයා

(iii) පුරාණ ගිවිසුමේ දවන පූජා වර්ග **දෙකක්** ලියන්න.

- සම්පූර්ණයෙන් දවන පූජා
- සහභාගිකමේ පූජා (සාම පූජා)
- පාප පූජා
- වන්දි ගෙවීමේ පූජා

(iv) ජන වන්දනාවේ ප්‍රධාන අංග **දෙකක්** නම් කරන්න

- දිව්‍ය පූජාව
- දේව ප්‍රසාද නිධාන
- යාම යැදුම

(v) ජේසුස් වහන්සේ විසින් අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේ දී සිදු කළ කාර්ය **දෙකක්** ලියන්න.

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම
- පූජකවරය ස්ථාපිත කිරීම
- අපෝස්තුළුවරුන්ගේ පාද දෝවනය කිරීම
- උත්තම පූජක යාච්ඤාව භාවිත කරමින් දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කිරීම

(vi) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් **දෙකක්** සඳහන් කරන්න

WWW.OLEVELAPI.COM

- ටෝරා
- නිතිය
- ව්‍යවස්ථාවලිය
- මෝසෙස්තුමාගේ නීතිය
- මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව

(vii) පාපයට වැටුණු ඒවට, දෙවියන් වහන්සේ දුන් දඬුවම් **දෙකක්** ලියන්න.

- ගැබ් ගැනීමේ වේදනාව බොහෝ සේ වැඩි කිරීම
- විලි රුදා ඇතිව දරුවන් ප්‍රසූත කිරීම
- සැමියාට ආදරය කළ ද ඔහු, ඇයව පාලනය කිරීම

(viii) සුළු දිවැසිවරුන් **දෙදෙනෙකු** නම් කරන්න.

| | | |
|---|---|---|
| හොසියා | ජොවෙල් | ආමෝස් |
| ඔබදියා | ජෝනා | මීකා |
| නාහුම් | හබක්කුක් | ශෙපනියා |
| හග්ගායි | සෙකරියා | මලාකි |

(ix) ශුද්ධ වූ ජොහන් තුමාගේ සුවිශේෂයේ සංකේතය දක්වා, එයින් ප්‍රකාශ වන අර්ථය ලියන්න.

- සංකේතය: රාජාලියා
- ප්‍රකාශ වන අර්ථය: ඉතා ගැඹුරු දේව ධාර්මික කරුණු අඩංගුවීම

(x) උත්පත්ති 3:6 ට අනුව හොඳ නරක අවබෝධ කරගැනීමේ ගසින් ඵල කඩා කෑම සඳහා ස්ත්‍රීය තම රුචිය ප්‍රකාශ කළ **යෙදුම්** දෙකක් ලියන්න.

- ගස කොතරම් රමණීය ද!
- ඵල කොතරම් ප්‍රණීත ද !
- නුවණ වැඩුමට කොතරම් කදිම ද!

*(ලකුණු 2 x 10= 20 යි)*

**2. ඉගෙනුම් ඵල: දේව කැඳවීමට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය සොයා බලයි.**

(i). එළිදරව් සාහිත්‍යයේ දක්නට ලැබෙන සංකේත **දෙකක්** සඳහන් කරන්න.

- සත්ත්ව සංකේත - බැටළුවා, මකරා /මෘගයා
- වර්ණ සංකේත - සුදු, රතු, කළු, සුදුමැලි
- සංඛ්‍යා සංකේත - 4, 7, 10, 12

*(ලකුණු 1 x 2 = 2 යි)*

(ii). එළිදරව් සාහිත්‍යයේ සංකේත ලෙස භාවිත කරන වර්ණ **තුනක්** ලියන්න.

- සුදු, රතු, කළු, සුදුමැලි

*(ලකුණු 1 x3 = 3 යි)*

(iii). ශුද්ධ වූ පේදුරු තුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගතහැකි ආදර්ශ **පහක්** විස්තර කරන්න.

- නිර්භීතව ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීම
- සේවාවේ දී ලැබෙන බාධක අභියෝගවලට එඩිතරව මුහුණ දීම
- ගැඹුරු ඇදහිල්ලකින් ජීවත් වීම
- සමාජයට නිවැරදි නායකත්වයක් සැපයීම
- විශ්වාසය හීන වී ඇති අයගේ විශ්වාසය ශක්තිමත් කිරීම
- වරදට පසුතැවිලි වීම

*(මෙවැනි කරුණු 5 ක් විස්තර කර ඇත්නම් ලකුණු 1 x 5 = 5 යි)*

WWW.OLEVELAPI.COM

**03. ඉගෙනුම් ඵල: දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී පූර්ණ කිතුනු දිවියකට සාක්ෂි දරයි.**

(i) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු **දෙකක්** ලියන්න.

- මෙල්කිසදෙක්ගේ යාගය (උත්පත්ති 14:18-20)
- මන්නා භෝජනය (නික්මයාම 16:4)
- නුමුහුන් පූප අනුභවය හා කුසලානෙන් පානය කිරීම (නික්මයාම 12:15-20)
- පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය (මතෙව් 14:15-21, මාක් 6:35-44, ලූක් 9:12-17,ජොහන් 6:5-13)

*(ලකුණු 1 x 2 = 2 යි)*

(ii) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු **තුනක්** ලියන්න.

- දෙවියන් වහන්සේට නමස්කාර කිරීම සඳහා
- දෙවියන් වහන්සේට තුති පිදීම සඳහා
- පාපවලට වන්දි ගෙවීම සඳහා
- ආත්මීක හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම සඳහා
- දිව්‍ය භෝජනයට සහභාගිවීම හා දිව්‍ය සත්ප්‍රසාදය වහන්සේ ලබාගැනීම සඳහා

*(මෙවැනි කරුණු 3 ක් ලියා ඇත්නම් ලකුණු 1 x 3 = 3 යි)*

(iii) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයෙන් සහ දේව වචනයෙන් පෝෂණය වන පවුලක සිය දරුවන් උදෙසා දෙමාපිය යුතුකම් **පහක්** විස්තර කරන්න.

- දේව ප්‍රසාද නිධාන ලබා දෙමින් දරුවන්ට ආධ්‍යාත්මික පෝෂණයක් ලබා දීම
- දරුවන්ට ප්‍රේම කිරීම හා ආරක්ෂාව සැපයීම
- දරුවන් ගුණ ගරුක හා බුද්ධිමත් ලෙස ඇතිදැඩි කිරීම
- විශ්වාසය තුළ නිසි අධ්‍යාපනයක් ලබාදීමට පාසලක් තෝරා ගැනීම
- දිනපතා යාච්ඤා කිරීමට යොමු කරමින්, යාච්ඤාව තුළ ජීවිතය ගොඩනගා ගැනීමට පෙළඹවීම
- යහපත් ආදර්ශමත් ජීවිතයක් ගත කිරීම

*(මෙවැනි කරුණු 5 ක් විස්තර කර ඇත්නම් ලකුණු 1 x 5 = 5 යි)*

**4. ඉගෙනුම් ඵල: ජන වන්දනාව තුළ යාච්ඤාවෙන් පෝෂණය වී මනුෂ්‍යයා දෙවියන් වහන්සේ සමග ගැඹුරු සබඳතාවක් ගොඩ නගා ගනි යි**

WWW.OLEVELAPI.COM

(i) ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජන වන්දනා දින **දෙකක්** ලියන්න.

- ගොබ් ඉරු දින
- මහ බ්‍රහස්පතින්දා දින
- මහ සිකුරාදා දින
- ආලෙලූයියා සෙනසුරාදා දින

*(ලකුණු 1 x2 = 2 යි)*

(ii) නත්තල් සමය තුළ සමරන වැදගත් මංගල්‍යයන් **තුනක්** නම් කරන්න.

- දෙසැම්බර් 25 (නත්තල) ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය
- දෙසැම්බර් 25 වන දිනට පසුව එන ඉරිදා - ශුද්ධ වූ පවුලේ මංගල්‍යය
- ජනවාරි 01 වන දා - පරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය
- ජනවාරි 02 - 08 අතර යෙදෙන ඉරිදා - දිව්‍ය බිළිඳාණන් රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යය හෙවත් රජ තුන් කට්ටුවේ මංගල්‍යය

*(ලකුණු 1 x 3 = 3 යි)*

(iii) ඉරු දින ශුද්ධවත් ව ගත කිරීම සඳහා ඔබෙන් ඉටු විය යුතු කාර්ය **පහක්** විස්තර කරන්න.

- සම්පූර්ණ දිව්‍ය පූජාවට නිසි සූදානමකින් යුතුව අර්ථාන්විතව භක්තියෙන් සහභාගි වීම
- ශාරීරික හා ආත්මික සූදානමකින් යුතුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම
- යාච්ඤාවලට හා ගැයෙන ගීතිකාවලට භක්තියෙන් සහභාගී වීම
- සතියේ වෙනත් දිනවලට වඩා යාච්ඤා කිරීම හා ඒ අනුව ජීවත් වීම
- පවුලක් වශයෙන් සියලුදෙනා ම එකට එකතු වී ජපමාලය උච්චාරණය කිරීම
- ශුද්ධ ලියවිල්ල කියවා මෙනෙහි කිරීම
- පසුගිය සතියේ සිදු වූ වැරදි වලට සමාව ඉල්ලා ගැනීම හා ඉදිරි සතියට අවශ්‍ය වරප්‍රසාද ඉල්ලා ගැනීම
- දයාවේ ක්‍රියාවල නිරත වීම
- ශාරීරික පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වීම
- ආත්මීක පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වීම
- දෙමාපියන්ට හා අන් අයට වෙනදාට වඩා සහය වීම
- මීසම තුළ පොදු කටයුතුවලට සහභාගී වීම

*(මෙවැනි කරුණු 5 ක් විස්තර කර ඇත්නම් ලකුණු 1 x 5 = 5 යි)*

**5. ඉගෙනුම් ඵල: මිනිස් බවේ උතුම්කම රකිමින් රුචියට වහල් නොවී නිවැරදි තීරණ ගනි යි.**

(i) පුරුෂයාගේ හදවතට සමීප ඉල ඇටයකින් ස්ත්‍රීය මැවීමෙන් හඟවන කරුණු **දෙකක්** ලියන්න.

- ඇය ඔහුගේ වහලියක් හෝ පාලිකාවක් නොවන බව
- ඇය ඔහුට සහය වන්නියක බව
- ඔවුන් අතර ඇත්තේ ප්‍රේමය මත පදනම් වූ සම්බන්ධතාවයක් බව
- ජීවිතය සම්පූර්ණ වීමට නම් ඔවුන් දෙදෙනාම අවශ්‍ය බව
- ඔවුන් දෙදෙනාට සමාන ගරුත්වයක් ඇතිබව

*(ලකුණු 1 x 2 = 2 යි)*

(ii) දෙවියන් වහන්සේ විසින් අප සැමට නිවැරදි මග යෑමට අවවාද කරන මාර්ග **තුනක්** ලියන්න.

- හෘද සාක්ෂිය
- දෙමව්පියන්
- වැඩිහිටියන්
- ගුරුවරුන්
- ආගමීක නායකයින්
- දස පනත

*(ලකුණු 1 x 3 = 3 යි)*

(iii) උත්පත්ති පොතෙහි සඳහන් මැවීමේ පුවත් ඇසුරෙන් අවබෝධ කරගත හැකි කරුණු **පහක්** විස්තර කරන්න.

- විශ්වය දෙවියන් වහන්සේ විසින් මවන ලද්දක් බව
- එය ආරක්ෂා කළ යුතු බව
- එය මනහර බව
- ලොවට පාපය ඇතුළු වූයේ මිනිසා නිසා බව
- පාපය ගැන දෙවියන් වහන්සේට චෝදනා කළ නොහැකි බව
- පාපය තිබුණ ද දෙවියන් වහන්සේගේ ප්‍රේමය අසීමිත බව
- මිනිසාට දඬුවම් ලැබුණේ පාපය නිසා බව
- සබත් දවස ශුද්ධ ලෙස ගත කළ යුතු බව
- මිනිසා අන් සියලුම මැවිලිවලට වඩා උතුම් බව

- සැමියා හා බිරිඳ එකිනෙකාට ගෞරවයෙන් හා ප්‍රේමයෙන් තම ජීවිත ගත කළ යුතු බව
- ස්ත්‍රිය මිනිසාට සහය වන අයෙක් බව
- බුද්ධිය හා නිදහස් කැමැත්ත අනුව කටයුතු කළ යුතු බව

*(මෙවැනි කරුණු 5 ක් විස්තර කර ඇත්නම් ලකුණු 1 x 5 = 5 යි)*

**6 ඉගෙනුම් ඵලඃ පරිණත කිතුනුවකු ලෙස ආදර්ශමත් පිවිතයක් ගත කිරීමට උත්සාහ දර යි.**

(i) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී "ක්‍රිසම්" (Chrism) තෛලයෙන් ආලේප කිරීමෙන් කිතුනුවකු වශයෙන් අප ශක්තිමත් කරනු ලබන්නේ කුමකට දැයි  කරුණු **දෙකක්** දක්වන්න.

- තම විශ්වාසය අනුව ජීවත් වීමට
- තම විශ්වාසයට එරෙහි සියලුම දෙයට විරුද්ධව සටන් කිරීමට
- පූජකයෙකු, දිවැසිවරයෙකු හා රජ කෙනෙකු වශයෙන් සේවය කිරීමට

*(ලකුණු 1 x 2 = 2 යි)*

(ii) ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සුදු වස්ත්‍රයෙන් සංකේතවත් කරන කරුණු **තුනක්** ලියන්න.

- ප්‍රසාද ස්නාපනය ලබන්නා ආත්මිකව පිරිසුදු වීම
- නැවත වරප්‍රසාද ජීවිතයට ඔසවනු ලැබීම
- ජේසුස් වහන්සේ අන්‍ය රූප විලාශ වීමේ දී සැරසී සිටි ධවල වස්ත්‍රය
- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ දී සැරසී සිටි ධවල වස්ත්‍රය
- ප්‍රසාද ස්නාපනය මගින් අප ක්‍රිස්තුන් වහන්සේගේ මහිමයට පංගුකාරයන් වීම

*(ලකුණු 1 x 3 = 3 යි)*

(iii) අභිවෘද්ධි ආලේපය නැමැති දේව ප්‍රසාද නිධානය ලැබීමට අවශ්‍ය සුදුසුකම් **පහක්** ලියන්න.

- ප්‍රසාද ස්නාපනය ලබා තිබීම
- නියමිත වයස (අවුරුදු 14) සම්පූර්ණ වී තිබීම
- ඉෂ්ට වරප්‍රසාදය තුළ ජීවත් විම (පාපයෙන් තොර වීම)
- නිසි ධර්මෝපදේශයක් ලබා තිබීම
- අභිවෘද්ධි ආලේපය ලැබීමට ඇති කැමැත්ත
- ක්‍රිස්තුන් වහන්සේගේ භේවා භටයෙකු වීමට සූදානම් වීම
- විශ්වාසය ප්‍රකාශ කිරීම (ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කිරීම)

WWW.OLEVELAPI.COM

*(මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු 1 x 5 = 5 යි)*

**7. ඉගෙනුම් ඵලඃ අන් අයගේ අභිවෘද්ධිය සඳහා පරිත්‍යාගශීලීව කටයුතු කරයි.**

**(i) භාග්‍යවත් තෙරේසා මවුතුමියගේ දයා සේවාව**

- ශුද්ධෝත්තම පියතුමාගෙන් විශේෂ අවසරයක් ලැබ 1948. 08. 17 වන දින "දයාවේ දූතිකාවෝ" නමැති පැවිදි නිකාය ආරම්භ කළ ශුද්ධ වූ තෙරේසා මවුතුමිය කල්කටා නගරය තුළ කිසිවකුගේ පිහිටක් නොලත් රෝගී, දුගී, අසරණ හා අනාථ ළමුන්ට සේවය කළාය.

- මරණාසන්නව පාර දෙපස වැටී සිටි අයට, කෙනෙකුගේ රැකවරණය හා උපස්ථානය ඇති ව මිනිසෙකු ලෙස මරණය ට පත්වීම ට අවස්ථාව ලබා දුන්නා ය.

- එතුමිය ප්‍රාදේශීය නායකයන්ගෙන් ඉල්ලා සිටියේ, "මට ගෙයක් දෙන්න, මැරෙන්න වැටී සිටින අයව මං බලා ගන්නම්" කියාය.

- වීදි දරුවන් සඳහා පාසලක් ආරම්භ කළ අතර මෙම පාසලට යන දරුවන් කිලිටි දුගඳ හමන අය වූ හ. ඔවුන්ව ආදරයෙන් පිළිගෙන, ශරීර හා ඇඳුම් පැළඳුම් පවිත්‍ර කර, ආහාර පානවලින් පෝෂණය කර අධ්‍යාපනය ලබා දුන්නා ය.

- වීදි ජනයා බැහැ දැකීමට යාමට ඇය පුරුදු වූවා ය.

- ජාති, ආගම්, කුල භේද නොතකා අසරණ දරුවන්, අනාථයන්, රෝගීන් හා මරණාසන්න වූවන්ට එතුමියගේ සෙවණ තුළ ආදරය නොඅඩුව ලැබිණි.

- තමා සන්තකව තිබූ රුපියල් පහක මුදලින් ආරම්භ කළ මෙම සමාජ සත්කාරයට ලැබුණු මහත් දේව ආශිර්වාදය නිසා එය ප්‍රබල ලෙස වර්ධනය විය.

- ඒඩ්ස් රෝගීන් රැකබලා ගැනීම සඳහා නිව්යෝර්ක් නගරයේ නගරාධිපතිව හමු වූ එතුමිය නිවසක් ඉල්ලා සිටියාය. එම ඉල්ලීම අනුව ලැබුණු නිවසෙහි ඒඩ්ස් රෝගීන් රැකබලා ගැනීමට කන්‍යා සොයුරියන්ව පත් කළා ය.

- ආදරය අහිමි අයට ආදරය රැකවරණය ලබාදීම මුඛ්‍ය පරමාර්ථය විය.

- එතුමියගේ සේවාවන් අතර මරණාසන්න රෝගීන් හා ඒඩ්ස් රෝගීන් සඳහා නිවාස පවත්වා ගෙන යාම ප්‍රධාන විය.

- මෙතුමියගේ මෙම දයා සේවාවන් නිසා "අසරණ සරණ දූතිකාව" හා "ජීවමාන සාන්තුවරිය" යන විරුදාවලි ලැබුවා ය.

(මෙවැනි කරුණු 5ක් විස්තර කර ඇත්නම් ලකුණු 05යි.)

**ඉගෙනුම් ඵල ඃ මුළු හෘදයෙන් ද, මුළු ආත්මයෙන්ද, මුළු වීර්යයෙන්ද, මුළු බුද්ධියෙන් ද දෙවියන් වහන්සේට ප්‍රේම කරයි.**

**(ii) පළමු දේව පනත අනුව දිවි ගත කරමු**

- සියලු ම දේට වඩා මුළුමනින්ම දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නට ඇරයුම් කරයි. "මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය..."යනුවෙන් නික්මයාම පොතේ පළමු දේව පනත සඳහන් වන අතර "නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු ආත්මයෙන් ද නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි වූ සමිඳාණන් වහන්සේට......... ප්‍රේම කරන්න" ලෙස අපට අවධාරණය කරයි.

- සැබෑ වූ එකම දෙවියන් වහන්සේ වන පීතෘ පුත්‍රයා හා ස්ප්‍රීතු සාන්තු යන එකම දෙවියන්ට පමණක් වන්දනා නමස්කාර කිරීම ලෙස අපට ඇරයුම් කරයි.

- පළමු දේව පනත විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය මත පදනම් වේ. දෙවියන් වහන්සේ ව නොදන්නාකම සෑම පාපයකට ම හේතු වේ.

- මිනිසාගේ මූලික වගකීම වන්නේ, දෙවියන් වහන්සේව විශ්වාස කිරීමත් ඒ විශ්වාසයට නිර්භීතව සාක්ෂි දැරීමත් ය.

- විශ්වාසය වර්ධනය කර ගැනීමට පළමු පනත අපිට ආරාධනය කරයි.

- සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරන බැවින් අපි ඔවුන් වහන්සේට නමස්කාර කිරීමටත් යාච්ඤා කිරීමටත්, බාරහාර වීමටත් යොමුවිය යුතු වෙමු.

- මෙම බාරහාර හා පොරොන්දු ඉටු කිරීම දෙවියන් වහන්සේට දක්වන ගෞරවයේ හා ප්‍රේමයේ සළකුණකි.

- පළමු පනතට අනුව දිවි ගෙවීමේ දී එම පනතට විරුද්ධ ක්‍රියාවලින් වැළකී සිටිය යුතුය.

- යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, හූනියම් කිරීම; අංජනම් බැලීම, නැකැත් බැලීම; නැකතට මුල් ගල තැබීම; සාත්තර ඇසීම; වෙනත් දෙවි දේවතාවන්ට බාරවීම වැනි ක්‍රියාවන් පළමු පනතට විරුද්ධ ක්‍රියාවලට නිදසුන් වේ.

- පවුලක් ලෙස කිතුනු සංසයක් ලෙස වන්දනා නමස්කාර කිරීම, ඉරුදින දිව්‍ය පූජා යාගයට සහභාගී වීම, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් යනාදියෙන් වැලකී දෙවිඳුන් තුළ පමණක් රැඳී සිටීම, වෙනත් දෙවි දේවතාවන්ට භාරහාර වීමෙන් හා පුද පූජා පැවැත්වීමෙන් වැලකීම, දෙවියන් වහන්සේ අපගේ ජීවිතයේ එකම ස්වාමියාණන් ලෙස පිළිගැනීම වැනි ක්‍රියාවන් තුළ නිරත වීමෙන් පළමු දේව පනත අනුව අර්ථවත්ව දිවි ගෙවිය හැකිය.

(මෙවැනි කරුණු 5ක් විස්තර කර ඇත්නම් ලකුණු 05යි.)

**ඉගෙනුම් එල ඃ ගිහි ධර්මදූත සේවාවකට සම්බන්ධ වී කටයුතු කරයි.**

**(iii) සාන්ත වින්සන් ද පාවුලා සමිතිය**

- භාග්‍යවන්ත පෙඩ්රික් ඔසනාම් තුමා විසින් ක්‍රි. ව. 1863 දී මෙම සමිතිය ආරම්භ කරන ලදී

- ඉතා දිළිඳු දුප්පත් බෙලහීන, අනාථ, විපතටපත්, නැති බැරි, අබාධිත, වයෝවෘද්ධ, අසරණ අයට සරණ වන, දයා ප්‍රේමය දක්වන, ජාත්‍යන්තර සම්බන්ධතා ඇති සංවිධානාත්මක ගිහි අපෝස්තලික සේවාවකි.

- ආගම්, ජාති, කුල, වර්ණ ආදී භේදවලින් තොර ව තම අසල්වැසියාට සරණ වෙමින් දයා සේවා මාර්ගයෙන් තම ක්‍රිස්තියානි ජීවිතය ප්‍රකාශ කිරීමට මග සැලැස්වීමත් සමාජ සේවයක් ලෙස නොව දයාවේ සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමත් මෙහි අරමුණු ලෙස සැලකේ.

- මෙම සමිතියේ සේවාවන් පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

  - ජනතා දුක් වේදනාවලට සංවේදී වීම මත සාමාජිකයන් තුළ පන්නරයක් හා හද ගැස්මක් ඇති කිරීම.
  - අනුන්ට උදව් කිරීම, තම සැලකිල්ල හා සුහද බව දැක්වීම.
  - තම හැකියා සහ තලෙන්තු අන් අය සමඟ බෙදා ගැනීම.
  - මහළු නිවාස පවත්වාගෙන යාම.
  - වෛද්‍ය සායන පැවැත්වීම.

WWW.OLEVELAPI.COM

(මෙවැනි කරුණු 5ක් විස්තර කර ඇත්නම් ලකුණු 05යි.)

**ඉගෙනුම් එල ඃ පරිසරය සංරක්ෂණය කරන ආකාරය නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.**

**(iv) කිතුනුවකු වශයෙන් පරිසරය සුරකීමට මගේ දායකත්වය.**

- සොබා දහමට ආදරය කිරීම හා ගරු කිරීම.
- පොළොවේ සශ්‍රීකත්වය ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම.
- අප ජීවත්වන පරිසරය අලංකාර කිරීම.
- පරිසරයේ සමතුලිතතාව ආරක්ෂා කිරීම.
- පරිසරය දූෂණය කිරීමෙන් මිදී එය වැළැක්වීමට දායකවීම.

- සරල දිවි පෙවතකට හුරුවීම.
- අනාගත පරපුර වෙනුවෙන් සම්පත් ඉතිරි කිරීම.
- පරිසරය විනාශ කරන අයට එහි ප්‍රතිවිපාක පෙන්වාදීම.
- භෞතික සම්පත් වැඩිවර්ධනය කොට ආත්මාර්ථයෙන් තොරව බෙදා හදා ගැනීම.
- තමන් සතු සම්පත් බෙදා ගැනීමට අන් අය දිරි ගැන්වීම.

(මෙවැනි කරුණු 5ක් විස්තර කර ඇත්නම් ලකුණු 05යි.)

(කෙටි සටහන් දෙකකට මුළු ලකුණු 05 + 05 = 10 යි. )

WWW.OLEVELAPI.COM